# 2020 ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මැතිවරණයට තරඟ කරන අපේක්ෂයන්ට සහ දේශපාලන පක්ෂවලට ස්ත්‍රීන් විසින් ඉදිරිපත් කරන ස්ත්‍රීන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය

**ප්‍රකාශනය**

ස්ත්‍රීන් වන අපි,  සියලු මානව අයිතිවාසිකම් අගයන සහ ඒවා ආරක්ෂා කරන, ප්‍රවර්ධනය කරන සහ ඒවා ඉෂ්ට කරන, සියලු මනුෂ්‍යයන්ට වෙනස් කොට සැලකීමකින් තොරව සමාන ලෙස සළකනු ලබන, සදාචාරාත්මක දේශපාලන සංස්කෘතියක් සහිත ප්‍රජාතන්ත්‍රවාදී සහ සාධාරණ සමාජයක්  වෙනුවෙන් කැපවන්නෙමු.

එමෙන්ම, සෑම කෙනෙකුටම නිදහස්ව, පීඩාවක් නැතිව, ගරුත්වයක් ඇතිව ජීවත්වීය හැකි, තමන් කැමති රැකියාවක් තෝරා ගැනීමට, ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් හා අධ්‍යාපනයක් ලබාගැනීමට, සුදුසු නිවසක් වෙත ප්‍රවේශවීමට, හිංසනයෙන් තොර අභිමානයෙන් ජීවත්විය හැකි වටිනාකම් හා වගවීම අගයන සමාජයක් සහ රාජ්‍යයක්  තුළ ජීවත්වීමට අපි උත්සාහ කරමු.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය නිසා සමාජය තුළ පවතින ගතානුගතික අර්ථනිරූපනයන්  මගින් ඓතිහාසිකව ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් සීමා කර ඇති අතර, ස්ත්‍රී පුරුෂ භූමිකාවන් ද ස්ත්‍රීන්ට හානිකර, ප්‍රතිරූපගත කිරීම් නියම කර ඇති බව අවධාරණය කරන්නෙමු.

ස්ත්‍රීන් සහ ඓතිහාසිකව කොන් කරනු ලැබූ අනෙකුත් ප්‍රජාවන්ට යුක්තිය වෙත ප්‍රවේශවීමට සහ අධිකරණ පද්ධතිය තුළ සාධාරණව සළකනු ලැබීමට හිමිකමක් ඇත. එසේම, සියලු සේවා ස්ථාන ආරක්ෂිතව සහ සියලු කණ්ඩායම් සහභාගි කරවා ගතහැකි පරිසරයක් විය යුතුය. රජය, මෙම මූලධර්මය පිළිගත යුතුවා මෙන්ම එය පිළිගැනීමට පුද්ගලික අංශයට ද බල කළ යුතුය.

**අපගේ ඉල්ලීම්**

**දේශපාලන ආයතන සහ භාවිතයන් :**

1 අමාත්‍ය මණ්ඩල සංඛ්‍යාව 20 නොඉක්මවන බවට සහ එම අමාත්‍ය මණ්ඩලයෙන් අවම වශයෙන් 25%ක් ස්ත්‍රීන්ගෙන් සමන්විත විය යුතු බව සහතික කිරීමට කැපවීම.

2 තීරණ ගැනීමේ ව්‍යුහයන් තුළ පාර්ලිමේන්තුව, පළාත් සභා, පළාත් පාලන ආයතන සහ රාජ්‍ය ආයතන තුළ ස්ත්‍රීන්ගේ නියෝජනය 25%ක අවමයක් තිබිය යුතු බවට තාවකාලික විශේෂ විධි විධාන සැළසිමට සහතික වීම..

3 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19වන  ව්‍යවස්ථා සංශෝධනයේ ප්‍රතිපාදන ආරක්ෂා කිරීමට කැපවීම.

4 සියලුම පිළිගත් දේශපාලන පක්ෂවල තීරණ ගැනීමේ ව්‍යුහයන් තුළ අවම වශයෙන් 25%ක  ස්ත්‍රී නියෝජනයක් තිබිය යුතු බව සහතික කිරීම සඳහා අනිවාර්ය නෛතික ප්‍රතිපාදන හඳුන්වා දීමට කැපවීම.

5 19වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කර ඇති සියලුම ස්වාධීන කොමිසන් සභා සඳහා පත්වීම් සිදුකිරීමේ දී ස්ත්‍රී පුරුෂභාවය තුළනය වන ආකාරයට කටයුතු කිරීමට කැපවීම.

6 19වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපිත කර ඇති ස්වාධීන කොමිසන් සහා යටතේ ස්වාධීන ජාතික ස්ත්‍රී කොමිසමන් සහාවත් ස්ථාපිත කිරීමට අවශ්‍ය නීති සම්පාදනය ඉක්මන් කිරීමට කැපවීම.

7 අනාගත පරපුර තුළ ප්‍රගතිශීලී චින්තනයක් ඇති කිරීම සඳහා සාමය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය යන සංකල්ප සියලු ජාතික අධ්‍යාපන විෂය මාලා තුළට අන්තර්ගත කර කිරීමට කැපවීම.

8 සියලුම ජාතික මට්ටමේ දත්ත, ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන්කොට දක්වීමට කටයුතු කිරීමට සහතික වීම.

9 බලපෑම්කරණයට ලක් වූ පුද්ගලයින් අතර යුක්තිය සහ විශ්වාසය ගොඩනැගීම සහතික කිරීම සඳහා සංක්‍රාන්ති යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණය ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කිරීම.

10 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගෙන ඇති සමානාත්මතාවය, ව්‍යවස්ථාව උල්ලංඝණය නොවන ආකාරයට රාජ්‍ය නොවන පාර්ශවයන්ගේ වගකීම් පිළිගැනීමට සහතිකවීම.

**මානව අයිතිවාසිකම් සහ නීති ප්‍රතිසංස්කරණ**

11 ශ්‍රී ලංකාව අපරානුමත (අනුමත) කර ඇති ''කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීමේ සම්මුතිය'' (CEDAW) ඇතුලු සියලුම ජාත්‍යන්තර ප්‍රඥප්තීන්, දේශීය නීති පද්ධතියට ඇතුළත් කිරීම හා ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම්වලට අදාල වන ආකාරයට පවත්නා නීති සංශෝධනය කිරීමට කැපවිය යුතුය.

12 දේපල අයිතියට, පරිහරණයට සහ කළමනාකරණය කිරීමට සමාන අයිතියක් ස්ත්‍රීන්ට තිබිය යුතුය. එම අයිතීන් ස්ත්‍රීන්ට සමානව භුක්ති විඳීමට හිමිකමක් නොමැති දැනට බලාත්මක අසාධාරණ නීති (විශේෂයෙන් තේසවලමේ නීතිය සහ ඉඩම් සංවර්ධන ආඥා පනත) සංශෝධනය හෝ පුලුල් කර සමාන අයිතිය තහවුරු කිරීමට කැපවිය යුතුය.

13 නව පාර්ලිමේන්තුව මාස 6ක් ඇතුළත, මුස්ලිම් ස්ත්‍රීන්ගේ ඉල්ලීම් පූර්ණ ලෙස සාක්ෂාත් කරගැනීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් සමඟ පූර්ණ එකඟතාවය සහතික කරමින් 1951 මුස්ලිම් විවාහ හා දික්කසාද පනත සංශෝධනය කිරීමට කැපවිය යුතුය.

**තොරතුරු හා වෛරී ප්‍රකාශ**

14 රාජ්‍ය අංශය ද ඇතුළත්ව මහජන අධ්‍යාපනය සහ ධාරිතා වර්ධනය තුළින් තොරතුරු දැනගැනීමේ අයිතියෙහි (RTI) ක්‍රියාපටිපාටින් සහ යාන්ත්‍රණයන් ශක්තිමත් කර ක්‍රියාත්මක කිරීමට කැපවීම.

**පාරිසරික ජීවනෝපායන් සහ පාරිසරික යුක්තිය හා සංවර්ධනය**

15 ස්ත්‍රීකරණයවීම තුළ ඇතිවන දරිද්‍රතාවය හඳුනාගනිමින්, දරිද්‍රතාවයෙන් පීඩා විඳින ස්ත්‍රීන්ගේ ගැටළු ආමන්ත්‍රණය කරන විශේෂ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට කැපවීම.

16 ස්ත්‍රීන්ගේ සාම්ප්‍රදායික යැපීම් මාර්ග සඳහා සහයෝගය ලබාදීමට, සම්පත් සැපයීම හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට කැපවීම

**ශ්‍රමය සහ වැඩ**

17 ගෘහස්ථ ශ්‍රමිකයන්ගේ යෝග්‍ය රැකියා සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO), සී189 සම්මුතිය අපරානුමත (වලංගු කිරීම) කිරීමට කැපවීම.

18 විදෙස්ගත ස්ත්‍රීන් හා පුරුෂයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් සැකසීම.

19 සෑම සේවා ස්ථානයක්ම ආරක්ෂිත හා යහපත් පරිසරයක් බවට පත් කිරීමට වගබලා ගතයුතුය. රජය මෙම මූලධර්මය පිළිපැදිය යුතු අතරම, පෞද්ගලික අංශය ඇතුලු රාජ්‍ය නොවන ආයතන තුළද එය බලාත්මක කිරීමට කැපවීම.

**ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ අයිතිවාසිකම්**

20 නීතිගත කර ඇති ස්ත්‍රී දූෂණ නීතිය මගින් සෑම ප්‍රජාවකටම අයත් ගැහැණු ළමයින්ට ආරක්ෂා වීමේ සමාන අයිතිය තහවුරු කළ යුතුය.

21 සුදුසු වයස් කාණ්ඩ අනුව ලිංගික හා ප්‍රජනන අධ්‍යාපනය, අධ්‍යාපන විෂයමාලාවට අනිවාර්ය අංගයක් ලෙස ඇතුළත් කිරීම හා ගුරුවරුන්ට ඒ පිළිබඳ පුහුණුවක් ලබාදීමට කටයුතු කිරීම.

**සංවර්ධන ප්‍රතිපත්ති හා ක්‍රියාවට නැංවීම :**

22 කාන්තා ගෘහ මූලික පවුල් සඳහා හිංසාවෙන් සහ පීඩාවෙන් තොරව ඔවුන්ට, ගෞරවාන්විතව නිදහසේ ජීවත් වියහැකි පරිසරයක් නිර්මාණය වන ආකාරයට සමාජ, ආර්ථික අයිතිවාසිකම් හා සුබ සාධන ප්‍රතිලාභ වර්ධනය වන ආකාරයට සැලසුම් සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

23 ස්ත්‍රීන් පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රගතිශීලි හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන බවට සහතික කිරීම.

24 වියපත් වීමේ ස්ත්‍රීකරණය හඳුනාගැනීම (ශ්‍රී ලංකාවේ වියපත් ජනගහනයෙන් බහුතරය ස්ත්‍රීන්ගෙන් සමන්විත වන බව) සහ ඔවුන්ගේ විශේෂ අවශ්‍යතා සහ වෙනත් අවශ්‍යතා වන නිවාස, සෞඛ්‍ය, ජීවනෝපායන් සහ ගමනා ගමනය සපුරාලීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට කැපවීම.

ජුනි 2020

කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය